# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2342/51 – 2023 ජූලි 28 වැනි සිකුරාදා – 2023.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2016/133.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.11.11 දිනැති හා අංක 2149/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් ගාල්ල, උළුවිටිකේ, කහදූවවත්ත පාර, නාවින්න පාර, අංක 21/ඩී හි පදිංචි එස්. කේ. ඩී. ගුණවර්ධන මයා සහ හලාවත, පුත්තලම් පාර, අංක 165 හි පිහිටි හලාවත වැවිලි සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 39990 – 20 (2023/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය

බේරුම්කරු : කේ. කේ. කේ. ධනපාල මැතිණිය ඉදිරියේදී ය

එස්. කේ. ඩී. ගුණවර්ධන,
නො. 21/ඩී, නාවින්න පාර,
කහඳූවවත්ත පාර,
උළුවිටිකේ,
ගාල්ල.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය: ඒ /112/2019
IR/COM/03/2016/133

සහ

හලාවත වැවිලි සමාගම,
නො. 165,
පුත්තලම් පාර,
හලාවත.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

පෙනී සිටීම : -
පළමු පාර්ශවය වෙනුවෙන් - බන්දුල ගමගේ නියෝජිත මහතා
දෙවැනි පාර්ශවය වෙනුවෙන් - නීතිඥ රුවින්ද වැලිකල මහතා ද,
ආයතනය නියෝජනය කරමින් සහකාර කළමනාකරණ ජනක රොෂාන් මහතා.

**බලතල පැවරීම :**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත්කර මා වෙත යොමුකර ඇත.

**ප්‍රදානය**

**එකී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ**

"විනය පරීක්ෂණයේ තීන්දුවට අදාළ අභියාචනා තීන්දුව මගින් 2013.08.01 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති, හලාවත වැවිලි සමාගමේ සේවය කරන එස්. කේ. ඩී. ගුණවර්ධන මහතාට වැඩ තහනම් කිරීමට පෙර හිමිව තිබූ වරප්‍රසාද අහිමිවීමෙන් හා වැඩ තහනමට ලක්කර සිටින ලද කාලසීමාව තුළ දී වැටුප් හා අනෙකුත් දීමනා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද? අසාධාරණයක් සිදුව ඇත්නම් හිමි විය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ"

**ආරවුලට අදාළ පසුබිම**

මෙම ආරවුලේ පළමු පාර්ශවය වන එස්. කේ. ඩී. ගුණවර්ධන 2008.04.15 වන දින හලාවත වැවිලි සමාගමේ දිවුලපිටිය වතුයායට අනුයුක්තව, වතු අධිකාරී තනතුර සඳහා සේවයට බැඳී ඇත. වරින් වර පුත්තලම හා පලුගස්වැව වතුයායන් වලටද අනුයුක්තව සේවය කර ඇත.

2012 වසරේ පලුගස්වැව වතුයායට අනුයුක්තව සේවය කරමින් සිටින අතරතුර 2012.01.23 වන දින මෙම ආරවුලට අදාළ පළමු පාර්ශවය කොළඹ කාර්යාලයේ වැවිලි අංශය වෙත අනුයුක්ත කර ඇත.

2012.06.09 වන දින චෝදනා පත්‍ර බාර දී වැඩ තහනමකට ලක් කර ඇත. ඉන් අනතුරුව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන අතර එහිදී චෝදනා පත්‍රයේ ඇති එක චෝදනාවකට පමණක් නිවැරදිකරු වී අනෙක් සියලු චෝදනාවලට වැරදිකරු වී ඇත. එබැවින් 2013.05.06 වන දින දරන ලිපිය මගින් මෙම ආරවුලේ පළමු පාර්ශවය, දෙවන පාර්ශවීය ආයතනය විසින් සේවයෙන් ඉවත් කර ඇත. ඉන් අනතුරුව මෙම ආරවුලේ පළමු පාර්ශවය මෙම නියෝගයට විරුද්ධව අභියාචනයක් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත අභියාචනයක් සිදුකරන ලදුව, සානුකම්පිත හේතු මත මෙම ආරවුලේ පළමු පාර්ශවය සහකාර වතු අධිකාරී තනතුරේ ප්‍රධාන කාර්යාලයේ 2013.08.01 වන දින සිට සේවයේ පිහිටුවනු ලබන අතර නමුත් සහකාර වතු අධිකාරී තනතුරක් කොළඹ ප්‍රධාන කාර්යාලයේ නොමැති වීම මත මෙම ආරවුලේ පළමු පාර්ශවය දෙවන පාර්ශවීය ආයතනය මගින් එම තනතුරට සමගාමී තනතුරක් වන සහකාර කළමනාකරු (අධීක්ෂණ හා සමාලෝචන) තනතුරේ පිහිටුවා ඇත.

එලෙස සේවයේ පිහිටු වීමෙන් අනතුරුව තමා වැඩ තහනම් කර සිටි කාලයට අදාල පසු වැටුප් හා අනෙකුත් දීමනා අහිමිකිරීමෙන් ද, අභියාචනා තීන්දුව මගින් 2013.08.01 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති මෙම ආරවුලේ පළමු පාර්ශවයට වැඩ තහනම් කිරීමට පෙර හිමිව තිබූ වරප්‍රසාද අහිමි වීමෙන්ද, අසාධාරණයක් වූ බවට කම්කරු පැමිණිල්ලක් යොමු කිරීමෙන් අනතුරුව එම ආරවුල සම්බන්ධයෙන් අවසන් නිගමනයකට එළඹීමට නොහැකි වීම මත මෙම ආරවුල බේරුම්කරණය මගින් විසඳා ගැනීම සඳහා බේරුම්කරණයට යොමු කර ඇත. නමුත් මෙම ආරවුලේ පළමු පාර්ශවය 2015.12.31 වන දින ස්වකැමැත්තෙන් සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

**නීතිමය පසුබිම**

මෙම ආරවුලට අදාල බේරුම්කරණ යොමුවට අනුව විසඳීමට ඇති පළමු ප්‍රශ්න ගත කරුණ වන්නේ:

"වැඩ තහනමට ලක්කර සිටින ලද කාල සීමාව තුළ දී වැටුප් හා අනෙකුත් දීමනා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද?" යන්නය.

මෙම ආරවුලේ පළමු පාර්ශවය හලාවත වැවිලි සමාගමේ පළුගස්වැව වත්තෙහි කාර්යක්ෂමතාව, දේපළ ආරක්ෂාව හා ගණුදෙනු කරුවන්ගේ ප්‍රතිචාර පිළිබද මතු වී ඇති ගැටලු සැලකිල්ලට ගනිමින් වත්තේ සුභසාධනය සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි කොළඹ කාර්යාලයට අනුයුක්ත කිරීමට පාලන අධිකාරිය විසින් තීරණය කර ඇති බව 2012.01.23 වන දින දරන පළමු පාර්ශවය විසින් බේරුම්කරණ විනිශ්චය සභාවට සලකුණු කර ඉදිරිපත් කරන ලද A2 දරන ලේඛනයෙන් සනාථ වේ. තවද එසේ සේවය කිරීමට ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් තමා තුල කිසිදු අකමැත්තක් නොතිබූ බව දෙවන පාර්ශවය වෙනුවෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී පළමු පාර්ශවය සාක්ෂි ලබාදෙමින් පිළිගෙන ඇත. ප්‍රධාන කාර්යාලයේ සේවයට අනුයුක්ත කර සිටින ලද කාල සීමාව තුල වතු අධිකාරී තනතුරට හිමි වැටුප පමණක් ලැබූ බවද වතු අධිකාරී තනතුරට අදාළ වෙනත් වරප්‍රසාද තමාට නොලැබුන බවද, එයට ප්‍රධාන හේතුව වන්නේ වතු අධිකාරී යනු ක්ෂේත්‍ර ගත රාජකාරියක් පමණක් වන නිසා බවද,

මෙම ආරවුලේ පළමු පාර්ශවය සාක්ෂි ලබාදෙමින් පිළිගෙන ඇත. තවද මෙම ආරවුලේ පළමු පාර්ශවය විසින් ප්‍රධාන කාර්යාලයේ සේවයට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් කිසිදු අකමැත්තක් තමා තුල නොතිබූ බවට, මෙම විනිශ්චය සභාවේ දී දෙවන පාර්ශවය විසින් මෙම ආරවුලේ පළමු පාර්ශවයෙන් අසන ලද හරස් ප්‍රශ්න වලදී පිළිගෙන ඇත.

ඉන් අනතුරුව A3 හෙවත් R1 දරන ලේඛනය මගින් මෙම ආරවුලේ පළමු පාර්ශවය වැඩ තහනමකට ලක් කර ඇත. එසේ වැඩ තහනමට ලක් කිරීමේ දී රාජකාරී තහනම් කරනු ලැබූ කාලය තුළ කිසිදු වැටුප් ගෙවීමක් සිදු කරනු නොලබන බව දැනුම් දී ඇත. මෙම ආරවුලේ යොමුවට විසඳීමට ඉදිරිපත් වී ඇති ප්‍රශ්නගත කරුණක් ලෙස මෙය බේරුම් කරණ විනිශ්චය සභාව සලකා බැලිය යුතුය.

ඒ අනුව මෙම ආරවුලේ පළමු පාර්ශවය වැඩ තහනමට ලක් කර ඇත්තේ මූල්‍යමය අකටයුත්තක් සම්බන්ධයෙන් බව මෙම විනිශ්චය සභාවේ දී සාක්ෂි ලබා දෙමින් මෙම ආරවුලේ පළමු පාර්ශවය පිළිගෙන ඇති අතර ඒ බව A4 හෙවත් R2 දරන සංශෝධිත චෝදනා පත්‍රය මගින්ද තහවුරු වේ.

ඒ අනුව මෙම ආරවුලේ පළමු පාර්ශවයට විරුද්ධව ඉදිරිපත් වී ඇති A4 හෙවත් R2 දරන සංශෝධිත චෝදනා පත්‍රය ප්‍රකාරව මෙම ආරවුලේ පළමු පාර්ශවයට විරුද්ධව එල්ල වී ඇති චෝදනා, මූල්‍යමය චෝදනා බැවින් එහි බරපතලතාවය මත වැටුප් සහිතව හෝ වැටුප රහිතවද චෝදනා විභාග කළ යුත්තේ යන්න තීරණය කල හැක්කේ විනය බලධාරියාට පමණක් බව දෙවන පාර්ශවීය ආයතනය මගින් මෙම ආරවුලේ පළමු පාර්ශවයෙන් අසන ලද හරස් ප්‍රශ්න වලදී පිළිගෙන සාක්ෂි ලබා දී ඇති අතර තවද දෙවන පාර්ශවීය ආයතනය මගින් සලකුණු කර මෙම බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R6 (b) දරන ලේඛනයෙන් ද ඒ බව තහවුරු වේ.

එම ස්ථාවරය බිඳහෙළීමට මෙම ආරවුලේ පළමු පාර්ශවය විසින් කිසිදු ආකාරයක ලේඛනමය හෝ වාචිකමය වෙනත් සාක්ෂියක් හෝ මෙම විනිශ්චය සභාවට ඉදිරිපත් කිරීමට සමත් වී නොමැත.

2012.10.10 වන දින A4 හෙවත් R2 දරන සංශෝධිත චෝදනා පත්‍රය මෙම ආරවුලේ පළමු පාර්ශවයට ලබා දුන් බවත්, ඒ අනුව දින 7ක් ඇතුළත මෙම ආරවුලේ පළමු පාර්ශවයට පිළිතුරු සැපයීමට කාලය ලබාදුන්නද එය ප්‍රමාණවත් නොවීම මත දින 14 ක කාලයක් සඳහා අවසර ලබාගෙන එම චෝදනා පත්‍රය සඳහා පිළිතුරු සැපයීම කල බවත්, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත් වූ බවත් මෙම ආරවුලේ පළමු පාර්ශවය සාක්ෂි ලබා දෙමින් පිළිගෙන තහවුරු කර ඇත.

බේරුම්කරණ යොමුවට විසඳී මට ඇති දෙවන ප්‍රශ්න ගත කරුණ වන්නේ ;

"විනය පරීක්ෂණයේ තීන්දුවට අදාළ අභියාචනා තීන්දුව මගීන් 2013.08.01 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති, හලාවත වැවිලි සමාගමේ සේවය කරන එස්. කේ. ඩී. ගුණවර්ධන මහතාට වැඩ තහනම් කිරීමට පෙර හිමිව තිබූ වරප්‍රසාද අහිමි වීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද? " යන්නය.

මෙම විනය නියෝගයට එරෙහිව මෙම ආරවුලේ පළමු පාර්ශවය විසින් අභියාචනයක් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත කරන ලද බව මෙම ආරවුලේ පළමු පාර්ශවය මෙම විනිශ්චය සභාවේ දී පිළිගෙන සාක්ෂි ලබා දී ඇති අතර එලෙස අභියාචනයක් ඉදිරිපත් කිරීමක් කර ඇති බව දෙවන පාර්ශවීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් කළමනාකරු මානව සම්පත් හා පරිපාලන විසින් ද පිළිගෙන ඇත.

එම අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් හලාවත වැවිලි සමාගමේ සභාපති තුමා වෙත යවන ලද 2013.07.19 වන දින දරන R4 ලෙස සලකුණු කර විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇති ලේඛනයේ R4(a) සලකුණු කර ඇති කොටසේ පහත පරිදි සඳහන් කොට ඇත.

"එහිදී දෙපාර්ශවය වෙතින්ම ඉදිරිපත් වූ කරුණු සලකා බලන ලදි. චූදිත නිලධාරී එස්. කේ. ඩී. එස්. ගුණවර්ධන මහතාට විරුද්ධව නගා ඇති සියලු චෝදනාවන් සඳහා ඔහු වරදකරු බව අදාළ වාර්තා අනුව සනාථ වේ. එසේ වුවද, චූදිතයාගේ වයස, සේවා කාලය, පවුල් පසුබිම ආදී කරුණු සැලකිල්ලට ගෙන සානුකම්පිත හේතූන් මත සහකාර වතු අධිකාරී තනතුරට පත්කර නැවත සේවයේ එම තනතුරට අදාළ ආරම්භක වැටුප් පියවරේ ප්‍රධාන කාර්යාලයේ සේවය සඳහා අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස හලාවත වැවිලි සමාගමේ සභාපති තුමා වෙත දන්වා ඇත "

ඒ අනුව හලාවත වැවිලි සමාගම විසින් 2005.07.29 වන දින දරන R5 හෙවත් A7 දරන ලේඛනය මගින් මෙම ආරවුලේ පළමු පාර්ශවය සේවයේ පිහිටු වීමට කටයුතු කර ඇත.

මෙම ආරවුල විභාගයේ දී පළමු පාර්ශවයේ මූලික සාක්ෂි විමසන අවස්ථාවේ දී A7 දරන ලේඛනය මගින් A5 දරන ලේඛනයෙන් මෙම ආරවුලේ පළමු පාර්ශවය සේවයෙන් ඉවත් කිරීමේ ලිපිය අහෝසි කරගෙන ඇති බවට සාවද්‍ය ලෙසින් සාක්ෂි මෙහෙය වීමක් කර ඇති අතර කිසිදු අවස්ථාවක A7 දරන ලේඛනය මගින් A5 දරන ලේඛනයේ වලංගුභාවය අහෝසිවන බවට එම ලේඛනයේ කිසිදු සඳහනක් කර නොමැත.

තවද A5 යනු මෙම ආරවුලේ පළමු පාර්ශවය විසින් කරන ලද අභියාචනය අනුව R4 දරන අභියාචනය මගින් ලබාදුන් අවසන් තීරණය පරිදි සේවයේ පිහිටු වීමේ ලිපියක් පමණකි.

එම R4 දරන ලේඛනය මගින් අදාළ අභියාචන තීරණයට පදනම් වූ කරුණු ඉතාමත් පැහැදිළිව R4(a) සඳහන් වේ. ඒ අනුව කිසිඳු අවස්ථාවක දෙවන පාර්ශවීය ආයතන මගින් මෙම ආරවුලේ පළමු පාර්ශවයට විරුද්ධව ගන්නා ලද විනය ක්‍රියාමාර්ගයට විරුද්ධව අභියාචන තීරණය ලබාදී නොමැති අතර මෙම ආරවුලේ පළමු පාර්ශවය වන එස්. කේ. ඩී. එස්. ගුණවර්ධන මහතාට විරුද්ධව නගා ඇති සියලු චෝදනාවන් සඳහා ඔහු වරදකරු බව අදාළ අභියාචන මණ්ඩලය තීරණය කර ඇති පසුබිමක නැවත සේවයේ පිහිටුවීම සානුකම්පිත හේතු මත පමණක් සිදුකරන බව R4 දරන අභියාචනා මණ්ඩල අවසන් තීරණයෙන් දැනුම් දී ඇත.

අභියාචනයේ අවසන් තීරණය මත මෙම ආරවුලේ පළමු පාර්ශවය සේවයේ පිහිටු වීමට කටයුතු කළද, හලාවත වැවිලි සමාගමේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ සහකාර වතු අධිකාරී තනතුරක් නොමැතිවීම නිසා හලාවත වැවිලි සමාගම විසින් කොළඹ ප්‍රධාන කාර්යාලයේ මෙම ආරවුලේ පළමු පාර්ශවය සහකාර වතු අධිකාරී තනතුරට සමගාමී තනතුරක් වන සහකාර කළමනාකරු (අධීක්ෂණ හා සමාලෝචන) තනතුරේ පිහිටුවීමට කටයුතු කර ඇති බව දෙවන පාර්ශවය විසින් මෙම ආරවුලේ පළමු පාර්ශවයෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී, මෙම ආරවුලේ පළමු පාර්ශවය පිළිගෙන ඇති අතර තවද එය දෙවන පාර්ශවීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් කළමනාකරු මානව සම්පත් හා පරිපාලන විසින් ද පිළිගෙන ඇති අතර වැඩි දුරටත් එම සාක්ෂිකරු තම සාක්ෂි මගින් තහවුරු කර ඇත්තේ සහකාර කළමනාකරු ( අධීක්ෂණ හා සමාලෝචන) තනතුර මෙම ආරවුලේ පළමු පාර්ශවයට ලබාදීමට කටයුතු කර ඇත්තේ සහකාර වතු අධිකාරී තනතුරක් ප්‍රධාන කාර්යාලයේ නොමැති වීම මත බවත්, එම සහකාර වතු අධිකාරී තනතුර වතු ක්ෂේත්‍ර ගත තනතුරක් පමණක් බවද තහවුරු කර ඇත.

තවද මෙම තනතුරු දෙකට අදාළ එනම් සහකාර වතු අධිකාරි හා සහකාර කළමනාකරු (අධීක්ෂණ හා සමාලෝචන) යන තනතුරු වල වැටුපේ වෙනසක් ඇති බවට, කිසිදු අවස්ථාවක මෙම ආරවුලේ පළමු පාර්ශවය වාචිකමය සාක්ෂි මගින් හෝ ලේඛනමය සාක්ෂි මගින් තහවුරු කිරීමක් කර නැත.

සෑම අවස්ථාවකම මෙම ආරවුලේ පළමු පාර්ශවය සාක්ෂි ලබා දී ඇත්තේ වතු අධිකාරී තනතුරට අදාළ දීමනා තමනට නොලැබුණ බවටය. නමුත් වතු අධිකාරී යනු ක්ෂේත්‍රගත රාජකාරියක් බවත් එම රාජකාරි කරගෙන යාමේ දී වතුවල කටයුතු අධීක්ෂණය පහසු වීම සඳහා පමණක් අදාළ පහසුකම් සපයා දී ඇති බවත්, කොළඹ ප්‍රධාන කාර්යාලයේ වතු අධිකාරී තනතුරට අදාල එවැනි ක්ෂේත්‍රගත රාජකාරි නොමැති බවටත්, මෙම ආරවුල විභාග වන අවස්ථාවේදී මෙම ආරවුලේ පළමු පාර්ශවය ද, ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් කළමනාකරු මානව සම්පත් හා පරිපාලන නිලධාරිවරයාගේ සාක්ෂියෙන් ද පිළිගෙන ඇත. තවද අභියාචනය පරිදි මෙම ආරවුලේ පළමු පාර්ශවය සේවයේ පිහිටුවීමට නියෝග කර ඇත්තේ සහකාර වතු අධිකාරී තනතුරේ වන අතර එම අවස්ථාවේ දී ද කොළඹ ප්‍රධාන කාර්යාලයේ එවැනි ක්ෂේත්‍ර ගත තනතුරක් නොමැති නිසා එම තනතුරට අදාළ වරප්‍රසාද ලබා දී නොමැති බව දෙපාර්ශවයේම සාක්ෂි මගින් තහවුරු වේ.

තවද ආරවුලේ පළමු පාර්ශවය විසින් අමාත්‍යාංශයට කරන ලද අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව පළමු පාර්ශවය කොළඹ ප්‍රධාන කාර්යාලයේ සේවයේ පිහිටු වීම සම්බන්ධයෙන් ද කිසිදු හබ කිරීමක් නොමැති බවත් එය තම ඉල්ලීම මත කල බවත් දෙවන පාර්ශවය වෙනුවෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී මෙම ආරවුලේ පළමු පාර්ශවය සාක්ෂි ලබා දෙමින් පිළිගෙන ඇති අතර වතු අධිකාරී තනතුරට අදාළ සියලු වරප්‍රසාද ලබාගෙන, ප්‍රධාන කාර්යාලයේ සේවය කිරීම තම අරමුණ වූ බව ද මෙම ආරවුලේ පළමු පාර්ශවය සාක්ෂි මගින් තහවුරු කර ඇත.

ප්‍රධාන කාර්යාලයේ විධායක ශ්‍රේණි සඳහා පමණක් නිල නිවාස, නිල රථ, හා කම්කරු දීමනා ලැබෙන බවට මෙම ආරවුලේ පළමු පාර්ශවය සාක්ෂි ලබා දී ඇති අතර, තම තනතුර විධායක ශ්‍රේණියේ තනතුරක් නොවන බවට මෙම ආරවුලේ පළමු පාර්ශවය විසින් පිළිගෙන ඇත. ඒ අනුවද මෙම ආරවුලේ පළමු පාර්ශවයට අදාළ තනතුරට හිමි වැටුපට වඩා වරප්‍රසාද හා දීමනා ලබා ගැනීමට හිමිකමක් නොමැති බවද තහවුරු වේ.

ඒ අනුව ඉදිරිපත් වී ඇති සියලු වාචිකමය හා ලේඛනමය සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව එළඹිය හැකි නිගමනය වන්නේ :

විනය පරීක්ෂණයේ තීන්දුවට අදාළ අභියාචනා තීන්දුව මගින් 2013.08.01 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති, හලාවත වැවිලි සමාගමේ සේවය කරන එස්. කේ. ඩී. ගුණවර්ධන මහතාට වැඩ තහනම් කිරීමට පෙර හිමිව තිබූ වරප්‍රසාද අහිමිවීමෙන් හා වැඩ තහනමට ලක්කර සිටින ලද කාල සීමාව තුළ දී වැටුප් හා අනෙකුත් දීමනා ලබා නොදීමෙන් කිසිදු අසාධාරණයක් හෝ අගතියක් සිදුවී නොමැති බවට තීරණය කරන අතර මෙම ආරවුලේ පළමු පාර්ශවය මුල්‍යමය වරදක් කර එම චෝදනාවන්ට වැරදිකරු වී ඇති පසුබිමක ආයතනයේ අනෙක් සේවකයන්ට මෙම තීරණය වැරදි පූර්වාදර්ශයක් වුව ද. දෙවන පාර්ශවීය ආයතනය අභියාචන තීරණයට අවනත වෙමින්, දෙන ලද තනතුර අදාල ප්‍රධාන කාර්යාලයේ නොතිබිය දී පවා කෙසේ හෝ එම තනතුරට අදාළ සමගාමී තනතුරක මෙම ආරවුලේ පළමු පාර්ශවය සේවයේ පිහිටුවීමම මෙම ආරවුලේ පළමු පාර්ශවය සම්බන්ධයෙන් දෙවන පාර්ශවීය ආයතනය මගින් ගෙන ඇති සාධාරණ හා යුක්ති සහගත තීරණයක් මෙන්ම මෙම ආරවුලේ පළමු පාර්ශවයට ලබා දී ඇති විශේෂ වරප්‍රසාදයක් ලෙස සැලකිය හැකිය.

එබැවින් බේරුම් කරණ යොමුවට යොමුකර ඇති ප්‍රශ්න ගත කරුණු සම්බන්ධයෙන් මෙම ආරවුලේ දෙවන පාර්ශවීය ආයතනය කිසිදු ආකාරයකින් අසාධාරණ තීරණයක් මෙම ආරවුලේ පළමු පාර්ශවයට විරුද්ධව ගෙන නොමැති බවට තීරණය කරමි.

එබැවින් පළමු පාර්ශවයට අදාළව ඉල්ලා ඇති කිසිදු සහයක් ලබා දීමට ප්‍රදානයක් ලබා නොදෙමි. ඒ අනුව මෙය යුක්ති සහගත හා සාධාරණ ප්‍රදානයක් බවට තීරණය කරමි.

බේරුම්කරු.

2023 ජූනි මස 30 වැනි දින.

EOG 07 -0272

මගේ අංකය: IR/COM/02/2020/118.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2336/13 දරන හා 2023.04.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ, එක් පාර්ශවයක් වශයෙන් මොනරාගල, ජයසේන්ගම, 39 හි පදිංචි එච්. එම්. රාජා කුමාරතුංග මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන්, බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 40/2022 දරන හා 2023.02.16 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් එච්. එම්. රාජා කුමාරතුංග මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A40/2022 දරන බේරුම්කාර ප්‍රදනය ක්‍රියාත්මක වීම 2024.04.03 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : එච්. එම්. රාජා කුමාරතුංග,
අංක 39, ජයසේනගම, මොණරාගල.

දිනය : 2023 ජුනි මස 01 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2023 අප්‍රේල් මස 03 දිනැති අංක 2326/13 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, එච්. එම්. රාජා කුමාරතුංග සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2023 පෙබරවාරි මස 16 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන :*

පිටපත : (අනෙක් පාර්ශවය)

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර, කොළඹ 05,

01. ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න).

02. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවා යොජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවා යොජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 07 - 0273

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.